# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2447/55 – 2025 අගෝස්තු මස 01 වැනි සිකුරාදා – 2025.08.01**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එම ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1036, පරණගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පරණගම (අ.ග.පි 566) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක KU/NRM/2022/95 හා 2022.09.25 වැනි දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අංක **01 – නැඳුන්ගොල්ල සහ පාළුවත්ත** *නොහොත්* **නැඳුන්ගොල්ලවත්ත – ප්‍රමාණය: හෙක්. 1.7307**

උතුරට : ඇළ (වියළි); නැගෙනහිරට: මාර්ගය (ප්‍රාදේශීය සභා); දකුණට සහ බටහිරට: මාර්ගය (ප්‍රාදේශීය සභා).

කේ. ඩී. ලාල් කාන්ත,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍ය.

*මගේ අංකය:* 4-3/18/2021/WS/312.
2025 මැයි මස 20 වැනි දින.
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
"මිහිකත මැඳුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 08 – 0006

1A – G 045013 – 14 (2025/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*